රුහුණ විශ්වවිද්‍යාලය
றுஹுணு பல்கலைக்கழகம்
UNIVERSITY OF RUHUNA
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
தொலை மற்றும் தொடர் கல்வி அலகு
Distance and Continuing Education Unit
වැල්ලමඩම මාතර 81000 ශ්‍රී ලංකාව வெல்லமடம மாத்தறை 81000 இலங்கை WELLAMADAMA, MATARA 81000 SRI LANKA

මගේ අංකය
எனது எண்
My No. }

ඔබේ අංකය
உங்களது எண்
Your No. }

2023.01.21

# උපදෙස් පත්‍රිකාව

ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන් වෙතයි,
ගෞරවනීය ස්වාමීන් වහන්ස / මහත්මයාණනි / මහත්මියනි / මෙනෙවියනි ,

## ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය- 2023

රුහුණ විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මඟින් පවත්වනු ලබන ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා සාර්ථකව නිමකළ ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන් සඳහා 2023 වසරේදී පවත්වනු ලබන ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය 2023 ජනවාරි මස 28 දින පෙ.ව.8.30 ට රුහුණ විශ්වවිද්‍යාලයීය රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවනාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ පිළිබඳව මේ වන විටත් ඔබව දැනුවත් කර ඇත. මෙහිදී පහත උපදෙස් අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එදින පෙරවරු 7.30 ට පෙර ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ලාභීන් රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවනාගාරය ඉදිරිපිට ඔබ වෙත ලබා දී ඇති අනුක්‍රමික අංකයේ අනුපිළිවෙළට පෙළ ගැසිය යුතුය. ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන්ගේ පෙරහැර ආරම්භ වූවාට පසු පැමිණෙන කිසිවකු ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය සඳහා උත්සව ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. මෙම උත්සවය විශ්වවිද්‍යාලයේ වැදගත් උත්සවයක් වන බැවින් ශාලාව තුළ සහ විශ්වවිද්‍යාලය තුළ දී විනයානුකූලව හැසිරීමට වග බලා ගත යුතුය.

### ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයට අදාළ දැනුවත් කිරීම

ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන් සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයේ දී හැසිරිය යුතු ආකාරය දැනුවත් කිරීම සඳහා පවත්වනු ලබන වැඩසටහන 2023.01.26 දින ප.ව. 6.00 ට Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වේ. ඒ සඳහා පහත Zoom සබැඳිය භාවිතා කර නියමිත වේලාවට සහභාගී විය යුතුය.

https://learn.zoom.us/j/66305961564?pwd=MUUyZzBjMTgxUXVjV2VHMlliQnlWUT09

Meeting ID: 663 0596 1564 / Passcode: Dceu@1234
(මෙම සබැඳිය ඔබ ලබා දී ඇති දුරකථන අංක ඔස්සේ කෙටි පණිවිඩයක් මගින් ද ලබා දීමට කටයුතු කෙරේ.)

### ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයට සහභාගී වන ආකාරය

ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභී භික්ෂූන් වහන්සේලා ලෝගු නොපළඳින අතර, ස්වකීය අනන්‍යතාව තහවුරු කර ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයට සහභාගී විය හැකිය. ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයට සහභාගී වන පිරිමි ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන් ජාතික ඇඳුමින් හෝ සම්පූර්ණ යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය. කාන්තා ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන් පෙරදිග සිරිතට අනුව විචිත්‍ර වර්ණයෙන් හා උත්සව විලාශයෙන් සාරියෙන් / ඔසරියෙන් සැරසී පැමිණිය යුතුය.

ඔබට මුද්‍රිත අනුක්‍රමික අංකයෙහි පිටපත් 02 ක් අවසර පත්‍ර සමඟ ලබා දෙනු ලැබේ. එහි රෝස පැහැති අනුක්‍රමික අංකය ඇඳුමෙහි වම්පස පැළඳිය යුතු අතර , සුදු පැහැති පිටපත උත්සව ශාලාවේදී ලබා දිය යුතු බැවින් එය ඔබ සතුව තිබීම අනිවාර්ය වේ.
ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන්ගේ පවුලේ සාමාජිකයන් දෙදෙනෙකුට ශාලාවට ඇතුල් වීමට අවස්ථාව සලසා ඇත. එම සාමාජිකයින් මෙම උත්සවයට ගැලපෙන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී සිටිය යුතුය.

## ඩිප්ලෝමා ලෝගු ආපසු බාර දීම

ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය අවසන් වූ වහාම ඩිප්ලෝමා ලෝගුව නැවත භාර දී අදාළ රිසිට්පත ලබා ගත යුතුය.එම කාල සීමාව ඉකුත් වීමෙන් අනතුරුව ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම දිනකට රු.250.00 බැගින් වන ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතුය. තවද ඒවා ඔබ භාරයේ තිබියදී යම් අලාභයක් හෝ හානියක් සිදු වී ඇත්නම් ඒවායේ සම්පූර්ණ වටිනාකම හා ඊට අතිරේකව 25% ගාස්තුවක් ද ගෙවීමට සිදුවනු ඇත. (ඩිප්ලෝමාලාභීන්ගේ සහතික පත්‍රය නිකුත් කරනුයේ ඩිප්ලෝමා ලෝගුව යලි භාර දීමෙන් පසුව බව කරුණාවෙන් සලකන්න)

## සහතිකපත්‍ර ප්‍රදානෝත්සව ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම

ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන්ගේ අමුත්තන් සඳහා ප්‍රවේශපත්‍ර 02 ක් නිකුත් කිරීමට කටයුතු යොදා ඇති අතර එම අවසර පත්‍ර මගින් දෙමාපියන්ට රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවනාගාරයේ අසුන්ගත හැක. කුඩා දරුවන් ( අවු.12 ට අඩු ) මෙම උත්සවයට සහභාගී විය නොහැකි බව කරුණාවෙන් සලකන්න. (ශාලාවට ඇතුල් වීමට ප්‍රෙවිශපත්‍ර ඉදිරිපත් කළ යුතුය.)
ඔබ පෞද්ගලික වාහන වල පැමිණෙන්නේ නම් ඒවා විශ්වවිද්‍යාලය මගින් වෙන් කර ඇති රථ ගාලක ගාල් කල යුතුය.

සහතික ප්‍රදානෝත්සවයට සහභාගී වන ඔබ වෙත ආහාර ටෝකන 2ක් ලබා දෙන අතර සහතික ප්‍රදානෝත්සවය නිමවීමෙන් පසු අදාල සහතිකපත්‍රලාභියාට පැමිණ එම ටෝකන් පත් දෙක ඉදිරිපත් කර ආහාර ලබා ගත හැකිය.

## ඡායාරූප ගැනීම

ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සව ශාලාව තුළ සහතික ප්‍රදානය කරන අවස්ථාව ඡායාරූප ගත කරවා ගැනීමට අවශ්‍ය ඩිප්ලෝමා සහ සහතිකපත්‍රලාභීන් විශ්වවිද්‍යාලය මඟින් නම් කරන ලද නිළ ඡායාරූප ආයතනය මගින් ඒ සඳහා අවස්ථාව සලසා ඇති අතර, ඒ පිළිබඳ වැඩි විස්තර දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ වෙබ් අඩවිය තුළින් ලබාගත හැක. විශ්වවිද්‍යාලය තුළ ඡායාරූප ගැනීමට අවශ්‍ය නම් එය කළ හැකි අතර දහවල් 12 වන විට විශ්වවිද්‍යාලය තුළින් ඉවත් විය යුතුය.

## සැලකිය යුතු කරුණු

ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත ඡායාරූප ගැනීම තහනම් වන අතර, උත්සව ශාලාව තුළට කැමරා හා ඡායාරූප උපකරණ හෝ බෑග් , ගමන්මලු ,ආහාර, ජලය, පාර්සල් ආදිය හෝ ජංගම දුරකථන ගෙන යාම ද සම්පූර්ණයෙන් තහනම් බව කරුණාවෙන් සලකන්න.

**ඩිප්ලෝමා සහතිකය වෙනුවට වේදිකාවේදී ලබා දෙනු ලබන්නේ සංකේතාත්මක සුබ පැතුමකි. එබැවින් ඔබ වෙත ප්‍රදානය කරනු ලබන** ඩිප්ලෝමාවට හෝ සහතිකපත්‍ර පාඨමාලාවට අදාළ මුද්‍රිත සහතිකය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සව දිනයේදීම නිකුත් කිරීමට විධි විධාන සලස්වා ඇත. ඒ සඳහා ශිෂ්‍ය හැඳුනුම්පත ද සමඟ ඩිප්ලෝමා ලෝගු නැවත භාර දුන් බවට නිකුත් කරන රිසිට්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය බව ද කාරුණිකව දන්වා සිටිමි.

මෙම ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයට සහභාගී වන ලෙසට ඔබට මෙයින් ආරාධනා කරන අතර ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ කාරුණික සහයෝගය හුදෙක්ම අපේක්ෂා කරනු ලැබේ.

ජ්‍යෙ.මහාචාර්ය වජිරා පී බුළුගහපිටිය
අධ්‍යක්ෂ
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය